## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

33 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ඇල් ඩී/ඩී 169.

මහනුවර දිස්ත්‍රික්කයේ අත්කර ගැනීමේ නිලධාරි ඩබ්ලිව්. අලුවිහාරේ වන මා විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 33 වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන ඉඩම රජයට අත්කර ගැනීම සඳහා ගෙවිය යුතු වන්දි මුදල වශයෙන් රු. 100 අයිතිකරුවන්ට ලබා ගැනීම පිණිස මහනුවර රික්වෙස්ට් උසාවියේ නඩු අංක 21501 ට බැර කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. අලුවිහාරේ,
අත්කර ගැනීමේ නිලධාරි,
මහනුවර දිස්ත්‍රික්කය.

1970 අගෝස්තු මස 29 දින,
මහනුවර කච්චේරියේ දී ය.

### උපලේඛනය

ඉඩමේ නම: ගල්වලවත්ත,
සැලැස්මේ අංකය: පීපී මහ 320,
කැබලි අංකය: 1,
බිම් ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 04.5.
පිහිටීම: මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රා. අ. නි. කොට්ඨාශයේ ගඟපළාත කෝරලයේ (උඩුනුවර) පිළිගල්ල ගමේ.

9–434—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

ගොනු අංකය: ඉද/2/117

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

හැගල්ල මහා විද්‍යාලය සඳහා ඉඩම් අත්කර ගැනීම

ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිට කෝරලේ බටහිර ප්‍රා. අ. නි. කොටසේ හැගල්ල ග්‍රාම සේවක වසමේ හිද්දරුවගම—ගා/218 දරණ මූලික පිඹුර.

කැබලි අංකය: 1.

ඉඩමේ නම: ගොරකගහවත්ත සහ දෙවටගහවත්ත; විස්තරය: අවු. 50ක් වයසැති පොල්ගස් 245කින්ද, අවු. 5-8 දක්වා වයසැති පොල්ගස් 4 කින්ද, අවු. 15-40 දක්වා වයසැති රටදෙල්ගස් 16 කින්ද, අවු. 10-15 දක්වා වයසැති අඹගස් 6 කින්ද, අවු. 5-10 දක්වා වයසැති පුවක් ගස් 15 කින්ද, ස්ථිර ගොඩනැගිලි 2 කින්ද, ස්ථිර වැසිකිළියකින්ද, වැන්කියකින්ද, තාප්ප දෙකකින්ද යුත් ඉඩම; ප්‍රමාණය: අ. 3, රූ. 2, පර්. 08.0.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1970. 10. 26 වැනි දින පූ. භා. 10 ට ගාලු කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1970. 10. 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ආර්. ඩබ්. හේරත්,
අත්කර ගැනීමේ නිලධාරි,
ගාලු දිස්ත්‍රික්කය.

1970. 8. 29 වැනි දින,
ගාලු කච්චේරිය.

9–344—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

අංකය: ඉ. අ. 2757.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම රජයට අත්කරගෙන ඇති බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මූලික සිතියම් අංකය: මාර 187.

පහත සඳහන් ඉඩම මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව හා කඩවත් සතරේ, මාලගොඩ බටහිර ගමෙහි පිහිටා ඇත :—

කැබලි අංකය: 1.

ඉඩමේ නම: උස්වත්ත; ඉඩමේ විස්තර: අවුරුදු 50ක් වයස්වූ පොල්ගස් 1ක්ද, අවුරුදු 10ක්වූ පුවක් ගහක්ද, කෙසෙල් පඳුරු 3ක්ද, ස්ථාවර ගොඩනැගිල්ලක්ද සහ වැසිකිළියක් තිබෙන වත්ත;

ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 20.0.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1970.10.18 වැනි දින අ. භා. 2ට මාතර දිසාපති කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1970.10.10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. තම තමන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියලු ඔප්පු හා අනෙක් ලියකියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

පී. ඩබ්ලිව්. සී. ද සිල්වා,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි, මාතර දිස්ත්‍රික්කය.

1970 සැප්තැම්බර් මස 1 වැනි දින,
මාතර කච්චේරිය.

9-405—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

අංකය: ඉ. අ. 2748.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම රජයට අත්කරගෙන ඇති බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

මුලික සිතියම් අංක මාර. 182.

පහත සඳහන් ඉඩම මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව හා කඩවත් සතරේ, වත්තෙගම පිහිටා ඇත:—

කැබලි අංකය: 1.

ඉඩමේ නම: ජයසේකරගෙ හේන; ඉඩමේ විස්තර: අවුරුදු 25-30 ක් වයස්වූ පොල් ගස් 4 ක්ද, අවුරුදු 15 ක් වයස්වූ පොල් ගහක්ද, අවුරුදු 4 ක්වූ පොල් පැලයක්ද, ඇස්බැස්ටොස් පියස්සක් ඇති, බදාම තාප්ප සහිත ස්ථාවර පේෂකම් පාසැල් ගොඩනැගිල්ලක් සහ බදාමෙන් සාදන ලද කොන්ක්‍රීට් පියස්ස ඇති ස්ථාවර වැසිකිළියක්ද තිබෙන වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, පර්. 20.0.

එකතුව: අ. 0, රූ. 0, ප. 20.0.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1970. 10. 19 වැනි දින පූ. භා. 9.30 ට මාතර දිසාපති කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1970. 10. 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තමතමන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියළු ඔප්පු හා අනෙක් ලියකියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

පී. ඩබ්. සී. ද සිල්වා,
ඉඩම් අත්කරගැනීමේ නිලධාරි,
මාතර දිස්ත්‍රික්කය.

1970 සැප්තැම්බර් 1 වැනි දින,
මාතර කච්චේරිය.

9-406—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

අංකය: ඉ. අ. 2761.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම රජයට අත්කරගෙන ඇති බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

මූලික සිතියම් අංක මාර/173.

පහත සඳහන් ඉඩම මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව හා කඩවත් හතරේ ඌරුගමුව බටහිර ගමෙහි පිහිටා ඇත.

කැබලි අංකය: 1

ඉඩමේ නම: පනාගහවත්ත; ඉඩමේ විස්තර: අවුරුදු 50ක් වයස් වූ පොල් ගස් 54 ක්ද, අවුරුදු 20 ක් වයස් වූ පොල් ගස් 130 ක්ද, අවුරුදු 5 ක් වයස් වූ පොල් පැල 5 ක්ද, අවුරුදු 50 ක් වයස් වූ කොස් ගස් 13 ක්ද, කජු ගස් 2 ක්ද, දෙල් ගහක්ද, කිතුල් ගස් 3 ක්ද, කොට්ට ගස් 4 ක්ද, ගොරක ගහක්ද, අඹ ගහක්ද, ජූල් ගස් 5 ක්ද, දොඩං ගහක්ද, අවුරුදු 15-30 ක්වූ ගුපූ ගහක්ද, පොල් අතු සෙවිලි කළ තාවකාලික වරිච්චි මඩුවක්ද, තාවකාලික වරිච්චි වැසිකිළියක්ද තිබෙන වත්ත; ප්‍රමාණය: අ. 3, රූ. 0, ප. 02.3.

එකතුව: අ. 3, රූ. 0, ප. 02.3.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 1970.10.18 වැනි දින පූ. භා. 9.30 ට මාතර දිසාපති කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1970.10.10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තම තමන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියළු ඔප්පු හා අනෙක් ලියකියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

පී. ඩබ්ලිව්. සී. ද සිල්වා,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
මාතර දිස්ත්‍රික්කය.

1970 සැප්තැම්බර් මස 1 වැනි දින,
මාතර කච්චේරිය.

9-421—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: ඉඅ/49

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට අණ්වුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ සම්මන්තුර ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ වඩයන්තලාව නමැති ගමේ පිහිටි පහතින් විස්තර කර ඇති, ප්‍රමාණයෙන් රූඩ 3, පර්චස් 17.7 ක් පමණ වූ කැබලි 6 කින් යුතු ඉඩම.

කැබලි අංකය: 1

ඉඩමේ නම: ආතර් කලෙයි පූමි; විස්තර: කුඹුරක් සහ පාරක්; හිමිකම් කියන්නන්ගේ නම: කල්මුනේ, වේනකුඩිඉරුප්පු, ඩොනල්ඩ් ද සිල්වා මහතා; ප්‍රමාණය: අ. 0, රූ. 1, පර්. 01.4.

කැබලි අංකය: 2.

ඉඩමේ නම: ආතර් කලෙයි පූමි; විස්තර: මුඩු බිමක් සහ පාරක් (කලින් පොල් ඉඩමකි); හිමිකම් කියන්නන්ගේ නම: කල්මුනේ, වේනකුඩිඉරුප්පු. ඩොනල්ඩ් ද සිල්වා මහතා; ප්‍රමාණය: අ. 0, රූ. 1, පර්. 24.4.

කැබලි අංකය: 3.

ඉඩමේ නම: ආතර් කලෙයි පූමි; විස්තර: හිස් මුඩු ඉඩමක්; හිමිකම් කියන්නන්ගේ නම: කල්මුනේ, වේනකුඩිඉරුප්පු, ඩොනල්ඩ් ද සිල්වා මහතා; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 01.07.

කැබලි අංකය : 4.

ඉඩමේ නම : නාමරෙයි මාඹු කලෙයිවලවු ; විස්තර : පොල් වත්තකි, අවු. 10ක් වයස පොල් ගස් 3ක් ද, අවු. 7ක් වයස අඹගස් 1ක් ද, අවු. 30ක් වයස සියඹලා ගසක් ද, මුඩු බිමක් සහ සහ පාරකින් යුතු ඉඩම ; හිමිකම් කියන්නන්ගේ නම : කල්මුනේ වේනකුඹිරුප්පු, කේ. කන්දයියා සහ කේ. කාලිමුත්තු යන මහත්වරුන් ; ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 13.3.

කැබලි අංකය : 5.

ඉඩමේ නම : කාලෙයි වලවු ; විස්තර : මුඩු බිමක් සහ පාරක් (කලින් පොල් ඉඩමකි) ; හිමිකම් කියන්නන්ගේ නම් : අම්පාර, නව සියරට ස්ටෝර්ස්හි එච්. ජී. පියදාස මහතා ; ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 16.4.

කැබලි අංකය : 6.

ඉඩමේ නම : කාලෙයි වලවු ; විස්තර : හිස් මුඩු බිමකි ; හිමිකම් කියන්නන්ගේ නම් : අම්පාර, නවසියරට ස්ටෝර්ස්හි එච්. ජී. පියදාස මහතා ; ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 00.5.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1970. 10. 4 වැනි දින පූ. භා. 10 ට සම්මන්තුරේ ප්‍රා. ආ. නි. කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1970. 9. 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. ,

එන්. සී. හාමි,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
අම්පාර දිස්ත්‍රික්කය.

1970 අගෝස්තු මස 27 වැනි දින,
අම්පාර කච්චේරිය.

9–323—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ මන්නාරම නගරයේ ග්‍රාම සේවක කොට්ඨාශයේ මන්නාරම නගර සභා සීමාව තුළ අංක 4 පෙරියකඩෙයි ජන්දදායක කොට්ඨාශයේ මැනුම්පති විසින් සකස් කර, ඔහු භාරයේ තබාගෙන ඇති පෙරියකඩේ අංක 8 පරිපූරක පිඹුරේ ලොට් අංක 234 ලෙස පෙන්නුම් කර ඇති, ප්‍රමාණයෙන් පර්චස් 29.24 ක්වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ' සිරප්පකුලතාඩි ඉඩම ' නොහොත් ' සිරප්පකුලම් තැනිතලාව ' නමැති පෞද්ගලික ඉඩම් කැබැල්ල :—

උතුරට : ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ භූමිය ;

නැගෙනහිරට : පේදුරු ඉලබෙලා නොහොත් මුත්තු යන අයගේ ඉඩම සහ ජෝසප් තේමිස් යන තවත් අය හිමිකම් කියන ඉඩම ;

දකුණට : පොන්නුගේ ඉඩම ;

බටහිරට : මන්නාරම දුම්රිය ස්ථානයට සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාර.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1970 ඔක්තෝබර් 17 වැනි දින පූ. භා. 10 ට මන්නාරම කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1970 ඔක්තෝබර් 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

එන්. වේදාරණිය සෙයොන්,
ආණ්ඩුවේ උප දිසාපති,
මන්නාරම දිස්ත්‍රික්කය.

1970 අගෝස්තු 30 වැනි දින,
මන්නාරම කච්චේරිය.

9–341—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

### වරද නිවරද කිරීම

ඉහත කාරණය පිළිබඳව 1970.3.13 දින අංක 14,897 දිනැති ගැසට් පත්‍රයේ පළවූ, ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ (460 පරිච්ඡේදය) 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමේ පෙනෙන, " උඩුකුඹල්වෙල ග්‍රාම සේවක වසමේ " යන්න " හල්පෙ ග්‍රාම සේවක වසමේ " යනුවෙන් නිවැරදි විය යුතු බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් දන්වා සිටිමි.

ජී. බී. දිසානායක,
බදුල්ල දිස්ත්‍රික්කයේ උප දිසාපති හා
අත්කර ගැනීමේ නිලධාරී.

1970.8.27 දා,
බදුල්ල කච්චේරියේදී ය.

9–332—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

මගේ අංකය : 4/6/2957.
දිසාපතිගේ අංකය : ඉලි. 14/1189.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයට අයත් හඳපානාගල ගමෙහි හඳපානාගල ජනපදයෙහි ප්‍රමාණයෙන් අ. 17, රූ. 0, ප. 0 ක් පමණ වූ ඉඩමෙන් අ. 4, රූ. 0, ප. 0 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් හඳපානාගල සිරිගැමුණු බෞද්ධ මධ්‍යස්ථානයට අවශ්‍ය විහාර මන්දිරය සහ පුස්තකාලය ඉදිකිරීම සඳහා හඳපානාගල සිරි ගැමුණු බෞද්ධ මධ්‍යස්ථානයේ භාරකරුවන් වන (1) ඒ. ඇම්. මුතුබණ්ඩා, (2) ඩී. ඇම්. කේ. බණ්ඩා, (3) එච්. ඇම්. කිරිබණ්ඩා, හඳපානාගල, ඇතිලිවැව යන අය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩමෙහි මෙයි පහත සඳහන් වේ :—

උතුරට : දැනට තිබෙන කරත්ත පාර ;

දකුණට : ප්‍රජා මධ්‍යස්ථානය සඳහා වෙන් කළ ඉඩමේ කොටස ;

නැගෙනහිරට : දැනට තිබෙන කරත්ත පාර ;

බටහිරට : දැනට තිබෙන කරත්ත පාර.

3. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :—

(අ) බද්ද : අවුරුද්දකට රු. 2.

(ආ) බදු ගන්නා විසින් බද්ද ඇරඹුනු දින සිට අවුරුදු 4 ක් ඇතුලතදී මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි එකී ඉඩමෙහි හඳපානාගල සිරි ගැමුණු බෞද්ධ මධ්‍යස්ථානයට අවශ්‍ය විහාර මන්දිරය සහ පුස්තකාලය තනා නිමකල යුතුයි.

(ඇ) බදු ගන්නා විසින් මෙම ඉඩම සමිතියට අවශ්‍ය විහාර මන්දිරය සහ පුස්තකාලය තැනීම පිණිස මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

(ඈ) බදු ගන්නා විසින් ඉහත (ආ) ඡේදයේ සඳහන් ගොඩනැගිලි සාදා නිමකර සමයක් ඇතුලතදී ඒවා මහා භාරකාර තැනගේ අනුමතිය ලද ඔප්පුවකින් පූජා කල යුතුයි. මෙසේ කල පසු, අවස්ථාවේ හැටියට භාරකාර තැනට හෝ විහාරස්ථානයේ පාලක විහාරාධිපති හිමිට හෝ ඉඩම සඳහා අවුරුදු 99ක බද්දක් දෙනු ලැබේ.

4. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුලතදී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකල හොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

සිංහ සේනානායක,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1970. 9. 11 වන දා,
කොළඹ, ඉඩම් කොමසාරිස් කායසීලයේ දීය.

9–324—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : 4/6/2561.
දිසාපතිගේ අංකය : ඇල්බී /ඇක්ස්/1521.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර නගර සීමාව තුළ පිහිටි අංක අයි. 25/13-4 නැගෙනහිර දරණ නගර සිතියමේ කැබලි අංක 44 දරණ අ. 1, රූ. 0, ප. 0ක වපසරිය ඇති ඉඩම් කොටස අංගොඩ කලපළුවාවේ සීමාසහිත මාතික මාතා සමිතියේ භාරකරුවන් වන,

(1) හෙරල්ඩ් ගුණවර්ධන, 291/30, හැව්ලොක් පාර, බම්බලපිටිය,

(2) නිශ්ශංක විජේවර්ධන, 100, හෝටන් පෙදෙස, කොළඹ 7,

(3) ප්‍රේමරත්න කුලසිංහ, 55, වෝඩ් පෙදෙස, කොළඹ 7,

යන අය විසින් ආරණ්‍ය වාසී භික්ෂූන් වහන්සේලා සඳහා භාවනා මධ්‍යස්ථානයක් ඉදිකිරීම පිණිස බදු ඉල්ලා ඇති බව මහ ජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :—

(අ) කාලය : අවුරුදු 99.

(ආ) බදු මුදල : අවුරුද්දකට රු. 180.

(ඇ) බදු ගන්නා විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු එකක් ඇතුළතදී මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති තැනගේ සිත්ගන්නා පරිදි එකී ඉඩමෙහි ආරණ්‍ය වාසී භික්ෂූන් වහන්සේලා සඳහා භාවනා මධ්‍යස්ථානයක් තනා නිමකළ යුතුයි.

(ඈ) බදු ගන්නා විසින් එකී ඉඩම ආරණ්‍ය වාසී භික්ෂූන් වහන්සේලා සඳහා භාවනා මධ්‍යස්ථානයක් තැනීම පිණිස විනා වෙනත් කටයුත්තක් සඳහා නොයෙද විය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළතදී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළ හොත්, ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

සිංහ සේනානායක,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1970. 9. 4 වැනි දා,
කොළඹ, ඉඩම් කොමසාරිස් කායසීලයේ දීය.

9–316—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : 4/6/3391
දිසාපතිගේ අංකය : එල්ඊ/7/122

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

පුත්තලම දිස්ත්‍රික්කයේ කුමාර වන්නි පළාතේ ආණමඩුව ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයට අයත්, රදයාය (සේරුකැලේ) ගමෙහි පිහිටි මූලික පිඹුරේ අංක 1821 වැනි අවසාන ගම් පිඹුරේ අංක 16 වැනි බිම් කැබැල්ලේ ප්‍රමාණයෙන් අක්. 10, රූඩ. 0, පර්. 00 පමණ වූ ඉඩමෙන් අක්කර 4, රූඩ 0, පර්. 00ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් නව බෞද්ධ විහාරස්ථානයකට අවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීම සඳහා සේරුකැලේ ශ්‍රී මහින්ද ශාසනවර්ධන බෞද්ධ සමිතියේ භාරකරුවන් වන

(i) විජේසිංහ රාජපක්ෂ ආරච්චිගේ ජෝන්සිංඤෝ
(ii) හේරත් දිසානායක මුදියන්සේලාගේ අප්පුහාමි
(iii) ජයසිංහ ආරච්චිගේ පීටර්සිංඤෝ
} සේරුකැලේ, ආඩිගම

යන අයවලුන් විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දක්වේ :—

උතුරට : වඳුරුස්ස කොටුවට යන පාර ;

දකුණට : ජනපදයේ අංක 96, 94 සහ 97 යන ඉඩම්වලට යන පාර;

නැගෙනහිරට : ජනපදයේ අංක 93 සහ 94 ඉඩම්;

බටහිරට : ග්‍රාම සංවර්ධන සමිති ශාලාව, රජයේ පොදු ළිඳ, සහ රජයේ බෙහෙත් ශාලාව පිහිටා ඇති ඉඩම් සහ ආඩිගම–බංගදෙනිය ප්‍රසිද්ධ පාරද වේ.

3. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට ඉඩම බදුදීමට රජය අදහස් කොට තිබෙ:—

(අ) බද්ද : අවුරුද්දකට රු. 3 යි.

(ආ) බදු ගන්නා විසින් බද්ද ඇරඹුනු දින සිට අවුරුදු 2ක් ඇතුලත දී පුත්තලම් දිස්ත්‍රික්කයේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි එකී ඉඩමෙහි බුදු මැදුරක්, බෝධියක්, ලැගුම් ගෙයක්, ධර්ම ශාලාවක්, ළිඳක් හා වැසිකිළියක් තනා නිම කළ යුතුය.

(ඇ) බදු ගන්නා විසින් මෙම ඉඩම සමිතියට අවශ්‍ය විහාරස්ථාන ගොඩනැගිලි තැනීම පිණිස මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) බදු ගන්නා විසින් ඉහත (ආ) ඡේදයේ සඳහන් ගොඩනැගිලි සාද නිම කර සමයක් ඇතුලත දී ඒවා මහාභාරකාර තැනගේ අනුමැතිය ලද ඔප්පුවකින් පූජාකළ යුතුය. මෙසේ කළ පසු අවස්ථාවේ හැටියට භාරකාරතැනට හෝ විහාරස්ථානයේ පාලක විහාරාධිපති හිමිට හෝ ඉඩම සඳහා අවුරුදු 99ක බද්දක් දෙනු ලැබෙ.

4. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුලත දී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිලිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළ හොත්, ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබෙ.

සිංහ සේනානායක,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1970 සැප්තැම්බර් මස 11 වැනි දින
කොළඹ, ඉඩම් කොමසාරිස් කායසීලයේදීය.

9–340—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

මගේ අංකය: 4/8/2304
දිසාපතිගේ අංකය: 2/100/1323

## 21(2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අග්බෝපුර ගමේ අංක 514/11/8බී දරණ කට්ටි කැබීමේ සිතියමේ ගොඩ ඉඩම් අංක 237 සහ 236 දරන ඉඩම් අතර පිහිටි තණ බිම් සඳහා රක්ෂිත ඉඩමින් අක්කර ½ ක් සමිති ශාලාවක් ඉදිකිරීම සඳහා අග්බෝපුර ග්‍රාම සංවර්ධන සමිතියේ භාරකරුවන් වන අග්බෝපුර අංක 69 පදිංචි ඩබ්ලිව්. ඇම්. පී. බණ්ඩා, අංක 198 පදිංචි ටී. ඇම්. හීන්බණ්ඩා සහ අංක 169 පදිංචි ඩබ්ලිව්. ජී. කිරිබණ්ඩා යන මහතුන් විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුලුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:—

(අ) කාලය: අවුරුදු 5 යි.

(ආ) බද්ද: අවුරුද්දකට රුපියල් 1 ශත 25 යි.

(ඇ) බදු ගන්නා විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු එකක් ඇතුලතදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි එකී ඉඩමෙහි අග්බෝපුර ග්‍රාම සංවර්ධන සමිතියට අවශ්‍ය සමිති ශාලාවක් තනා නිම කළ යුතුය.

(ඈ) බදු ගන්නා විසින් මෙම ඉඩම සමිතියට අවශ්‍ය සමිති ශාලාවක් තැනීම පිණිස මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුලත මෙම ඉඩම බදු නොදියයුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ජිංහ සේනානායක,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1970 සැප්තැම්බර් මස 11 දින,
කොළඹ, ඉඩම් කොමසාරිස් කාර්යාලයේ දීය.

9-336—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය: 4/8/2481.
වවුනියා දිසාපතිගේ අංකය: එල්එච්/එල්/827

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

වවුනියාව දිස්ත්‍රික්කයේ වවුනියා උතුර ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයට අයත් ඔඩ්ඩුසුඩාන් යන ගමෙහි පිහිටි ඉඩමෙන් අ. 0, රූ. 0, පර්. 4.4ක් පමණවූ රජයේ ඉඩම් කැබැල්ලක් ඔඩ්ඩුසුඩාන්, විවිධ සේවා සමුපකාර සමිතියට අවශ්‍ය ඩීසල්, භූමිතෙල් විකිණීමේ ස්ථානයක් සඳහා ගොඩනැගිලි ඉදි කිරීම පිණිස, ඔඩ්ඩුසුඩාන් විවිධ සේවා සමුපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩමේ මායිම් පහත සඳහන් වේ:—

උතුරට: පාරට සඳහාවූ රක්ෂිත ඉඩම;

දකුණට: පිවිසීම් මාර්ග සඳහා රක්ෂිත ඉඩම;

නැගෙනහිරට: කඩ සඳහාවූ ඉඩමේ කට්ටි අංක 2;

බටහිරට: රජයේ රක්ෂිත ඉඩම.

3. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුලුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:—

(අ) කාලය: අවුරුදු 30 යි.

(ආ) බද්ද: වර්ෂයකට රු. 1.65 යි.

(ඇ) බදු ගන්නා විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු එකක් ඇතුලතදී වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි එකී ඉඩමෙහි ඩීසල්, භූමිතෙල් විකිණීමේ ස්ථානයක් සඳහා අවශ්‍ය ගොඩනැගිලි තනා නිම කළ යුතුය.

(ඈ) බදු ගන්නා විසින් මෙම ඉඩම ඩීසල් සහ භූමිතෙල් විකිණීම සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි තැනීම පිණිස මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

4. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුලතදී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

සිංහ සේනානායක,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1970 සැප්තැම්බර් මස 11 දින,
කොළඹ, ඉඩම් කොමසාරිස් කාර්යාලයේදී ය.

9-374—70.9.11 දින අංක 14,923 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට හැකිවන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | ... 70. 6. 5 සිකුරාද | ... 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | ... 70. 7. 2 බ්‍රහස්පතින්ද | ... 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | ... 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | ... 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | ... 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | ... 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | ... 70. 8. 7 සිකුරාද | ... 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | ... 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | ... 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | ... 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | ... 70. 9. 4 සිකුරාද | ... 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | ... 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | ... 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | ... 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... 70.10. 2 සිකුරාද | ... 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | ... 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | ... 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | ... 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | ... 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | ... 70.11. 5 බ්‍රහස්පතින්ද | ... 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | ... 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | ... 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | ... 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | ... 70.12. 4 සිකුරාද | ... 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | ... 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | ... 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | ... 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | ... 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී